ජාතික ලොතරැයි මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින්, සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියා ත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිත තාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අග යන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද, පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 හි 30 ඡේදයට පටහැනිව තිස් අවුරුදු (30) බදු පදනම මත ලබාගෙන තිබූ අනුරාධපුරයේ සහ මන්නාරමේ ඉඩම් දෙකේ ඉදිකරන ලද සංචාරක නිවාස දෙක පසුගිය වර්ෂයේ සාධාරණ ආකෘතියට අනුව මිනුම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පිරිවැය ආකෘතිය අනුව හඳුනාගෙන රු.2,485,500 කින් ක්‍රමක්ෂය කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් ගිණුම් ප්‍රතිපත්තිය අඛණ්ඩව භාවිතා කර නොමැති අතර ගිණුම් ප්‍රතිපත්තියේ සිදුකර තිබූ එම වෙනස් කිරීම මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ ද හෙළිදරව් කර නොතිබුණි.	ආයෝජන දේපළ සම්බන්ධයෙන් ආයතනයට වඩාත් ඵලදායි සහ ප්‍රයෝගික වන මිනුම්කරණ ආකෘතිය පිරිවැය ආකෘතිය බැවින්, ඉදිරි ගිණුම් වර්ෂයේ සිට ඒ සඳහා පිරිවැය ආකෘතිය භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.	මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී **ගිණුම්කරණ ප්‍රමිති** නිවැරදි ආකාරයෙන් අදාළ කර ගත යුතුය.
(ආ)	මණ්ඩලය විසින් රූපවාහිණී නිවේදක /නිවේදිකාවන් 04 දෙනකුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවේ විභාග වෙමින් පවතින නඩු 4 ක සහ මණ්ඩලයේ සේවකයකු අනිවාර්ය විශ්‍රාම ගැන්වීම මත කම්කරු විනිශ්චය සභාව විසින් ලබාදුන් තීන්දුවකට එරෙහිව මණ්ඩලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ නඩුවක් සම්බන්ධයෙන් අවසන් තීන්දු 2024 දෙසැම්බර් 31 දක්වා ලබාදී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි 40 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.	රූපවාහිනි නිවේදක/නිවේදිකාවන් 04 දෙනෙකුගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් නඩු හතරක් කම්කරු විනිශ්චය අධිකාරියේ විභාග වෙමින් පවතී. තවද ජාතික ලොතරැයි මණ්ඩලයේ රියදුරෙකු අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හේතුවෙන් ඔහු විසින් කම්කරු විනිශ්චය අධිකාරියේ පවරා තිබූ නඩුවක් සම්බන්ධයෙන් රු. 1,279,437 ක මුදලක් කම්කරු විනිශ්චය අධිකාරියේ තැන්පත් කරන ලෙසට ලබා දුන් තීන්දුවට එරෙහිව අභියාචනා කරන ලද අතර එම අභියාචනා නඩුව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.	ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ලොතරැයි ත්‍යාග ගෙවීම් ගිණුම් ගත කිරීමේදී ලොතරැයි වර්ග 05කට අදාළ විශේෂ අංක යටතේ වූ ත්‍යාග ගෙවීම් රු199,381,719. ක් මණ්ඩලයේ සාමාන්‍ය ත්‍යාග ගෙවීම් රටාව යටතේ ගිණුම් ගත නොකරග සංචිත පෙර වර්ෂයේ ත්‍යා , .භාවිතා කර ගිණුම් ගත කර තිබුණි	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිනුම් අදිනු ලබන ලොතරැයිවර්ග 07ට අදාළව ත්‍යාග සංචිත ගිණුමෙහි ශේෂයන්හි වෙනස ඒ ඒ ලොතරැයිපත්වලට අදාළ ත්‍යාග වියදම් ගිණුම් තුළ නිවැරදිව ගැලපීම සිදු කර ඇත. එබැවින් 2024 වර්ෂයේ ලාභය නිවැරදි බව පෙන්වා දෙමි.	සමාලෝචිත වර්ෂයට අදාළ විශේෂ අංක යටතේ වූ ත්‍යාග ගෙවීම් ද සාමාන්‍ය ත්‍යාග ගෙවීම් රටාව යටතේ සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත යුතුය.
(ආ)	1963 අංක 11 දරන මුදල් පනතේ (4)16 හා 1997 අංක 35 දරන සංශෝධන පනතේ 4(4) සහ (4)5 වගන්තියේ විධිවිධානවලට පටහැනිව 2024 ජනවාරි 01 සිට ජුනි 30 දින දක්වා පවත්වනු ලැබූ ලොතරැයි වර්ග 05 ක මාස 06 ක් ඉක්ම වූ හිමිකම් නොපෑ විශේෂ මුදල් ත්‍යාග රු.76,501,720 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණු අතර එම ගෙවිය යුතු වගකීමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.	එම විශේෂ පාරිභෝගික ප්‍රවර්ධන ත්‍යාග මුදල් රාජසන්තක නොකරන අතර එම ත්‍යාග සඳහා වෙන් කරන ලද මුදල් අදාළ ත්‍යාග සංචිත අරමුදලෙහිම තබා ගනු ලබන අතර ත්‍යාගලාභීන් ඉදිරිපත් නොවූ භාණ්ඩ ත්‍යාග නැවත ඉදිරි විශේෂ ත්‍යාග ලෙස ලබා දීමට කටයුතු කරනු ලබයි. එබැවින් එම මුදල භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදලක් ලෙස සටහන් කරනු නොලබයි.	පනතේ විධි විධාන අනුව මාස 06 ක් ඉක්ම වූ හිමිකම් නොපෑ සියළුම මුදල් ත්‍යාග ඒකාබද්ධ අරමුදලට ලබාදිය යුතු ය.
(ඇ)	2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ලොතරැයි අලෙවි නියෝජිතයින් විසින් මහජන බැංකුවේ රැස් කිරීම් ගිණුමට තැන්පත් කර තිබූ එකතුව රු. 37,584,371 ක් සමාලොචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගිණුම් ගත කිරීමකින් තොරව දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ හඳුනා නොගත් බැර ශේෂයක් ලෙස දක්වා තිබුණි	මහජන බැංකුවේ රැස් කිරීමේ ගිණුමට අලෙවි නියෝජිතයින් විසින් තැන්පත් කල 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අදාල බිල්පත් නිකුත් නොකල වටිනාකම රු.37,584,370.93ක් වන අතර මෙය බැංකු සැසඳුම් ප්‍රකාශනයෙහි පැහැදිලිව ඉදිරිපත් කර ඇත. මෙම මුදල තුළ ඇතුලත් වනුයේ දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් විසින් තැන්පත් කරනු ලබන මුදල් තැන්පතුය.	අලෙවි නියෝජිතයින් විසින් මණ්ඩලයේ බැංකු ගිණුමට තැන්පත් කරන මුදල් කඩිනමින් මණ්ඩලයේ අදාළ ගිණුම්වලට ගැලපීය යුතුය.
(ඈ)	මණ්ඩලයේ Fortune පරිගණක පද්ධතිය මඟින් ලබාගත් දෛනික ලොතරැයි විකුණුම් ආදායම් වාර්තා සමඟ සැසඳීමේදී සාමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් දක්වා තිබූ ලොතරැයි විකුණුම් ආදායම්වල රු.119,600 ක අඩුවක් නිරීක්ෂණය විය.	මෙම ප්‍රතිඵලයට හේතුවී ඇත්තේ Fortune පරිගණක පද්ධතියෙහි මෘදුකාංගයේ පවතින දෝෂයන් කිහිපයකි. එහෙත් මෙම දෝෂය මෙම මෘදුකාංගයේ මුලාශ්‍ර කේතයන් ජාතික ලොතරැයි මණ්ඩලය සතු නොවීමත් සේවා සපයන ආයතනය 2015 වසරේ සිට සේවා සැපයීමෙන් ඉවත් කිරීමත් හේතුවෙන් මෙම ගැටලුවට ස්ථිර විසඳුමක් ලබා දීමට නොහැකි වී ඇත.	ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ආදායම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය.

(ඉ)	මණ්ඩලයේ සේවකයන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.1,518,203 ක ණය ශේෂ 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු විවිධ ආදායම් ලෙස පෙන්නුම් කර තිබුණි.	මෙම මුදල ඉදිරියේදී ලැබිය යුතු සේවක ණය ලෙස දැක්වීමට සටහන් කර ගනිමි.	මූල්‍ය ප්‍රකාශන මගින් ගිණුම්කරණ තොරතුරු නිවැරදිව වර්ගීකරණය කර ප්‍රකාශ කල යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලද තොරතුරු අනුව, මණ්ඩලය නමින් එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ මෝටර් රථ 06 ක් අස්ථානගත වී තිබූ අතර එම මෝටර් රථ පිළිබඳ තොරතුරු කිසිවක් මණ්ඩලයේ ලේඛන ගත වී නොතිබුණි.	මෙම මෝටර් රථ වසර 20ක් පමණ පැරණි වන අතර එම මෝටර් රථ පිළිබඳ ලේඛණ වර්ථමානයේ ජාතික ලොතරැයි මණ්ඩලය සතුව නොපවතී. මේ හේතුවෙන් මෙම කරුණු සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් විමසීමක් සිදු කළ අතර ඔවුන් විසින් ලබා දුන් උපෙදස් අනුව, එකී වාහන හිමිකම් පවරා ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවේදී හෝ එම වාහනවල ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වන අවස්ථාවන්හිදී මණ්ඩලයෙන් විමසීමක් සිදු කරන ලෙසට ඉල්ලා, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත.	මණ්ඩලය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෙම වාහන ලියාපදිංචියේ පවතින බැවින් වහාම පරීක්ෂණයක් සිදුකර ප්‍රගතිය ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්තා කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් 41 ක් වෙතින් බැංකු ඇපකර හෝ වෙනත් ප්‍රමාණවත් සුරක්ෂිත ලබාගැනීමකින් තොරව ලොතරැයිපත් ණයට අලෙවිකර තිබූ අතර ඔවුන් වෙතින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.58,036,119 ක් අය විය යුතුව තිබුණි.	මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන ලොතරැයිපත් සඳහා විශේෂ දිනුම්වාර පවත්වනු ලබන අතර එහිදී බැංකු ඇපකර මත පමණක් නොව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ලොතරැයිපත් ණය පදනම මත නිකුත් කරනු ලැබේ. එසේ විශේෂ දිනුම් වාර සඳහා 2024.12.31 දිනට පැවති ණය ශේෂය රු.58,036,119 ක් වන අතර 2025.04.30 දිනට අය විය යුතු ශේෂය රු.7,601,715.00 ක් වේ.	ලොතරැයිපත් ණයට අලෙවි කරනු ලබන අලෙවි නියෝජිතයන්ගෙන් ණයට ලබාදෙන උපරිම සීමාව ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබා ගත යුතුය.
(ආ)	කාර්ය මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් 04 ක් සහ පැසිව් ලොතරැයි නියෝජිතයන් 79 ක් වෙතින් මණ්ඩලය වෙත රු. 114,339,109 ක ශේෂයක් අයවිය යුතුව ඇතත්, එකී ශේෂ සඳහා ශේෂ සනාථන ලිපි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සෑම වර්ෂයකම අවසාන දිනට පවතින ණයගැති ශේෂය සනාථ කර එවීම සඳහා මූල්‍ය අංශය විසින් ලියාපදිංචි තැපෑලෙන් ලිපි යවා ඇති අතර විද්‍යුත් තැපැල මගින් හා කලාප කළමනාකරුවන් හරහා ද මේ පිළිබඳව දිස්ත්‍රික් අලෙවි නියෝජිතවරුන් දැනුවත් කරන ලදී. ශේෂ තහවුරු කර නොඑවන්නේ නම් එම ශේෂය නිවැරදි ශේෂය ලෙස සලකා ඉදිරි කටයුතු කරන බවට ඔවුන් වෙත යවන ලද ලිපිවල දක්වා ඇති බැවින් එම ශේෂයන් නිවැරදි ශේෂ ලෙස සලකා කටයුතු කර ඇත.	සියළුම ණයගැතියන්ගෙන් ශේෂ සනාථන ලිපි විගණනය වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

(ඇ)	මණ්ඩලයේ ගිණුම් අනුව අලෙවි **නියෝජිතයින්** 11 දෙනකුගේ ලැබිය යුතු ශේෂය රු.9,399,449 ක් වුවත්, ශේෂ සනාතන ලිපි අනුව ශේෂය රු.3,082,409 ක් වීම හේතුවෙන් රු.6,317,040 ක වෙනසක් දක්නට ලැබුණි.	2024.12.31 දිනට පවත්නා ණය ශේෂය ඇතුළත් කරමින් ඉහත පරිදි අලෙවි නියෝජිතයන් වෙත ශේෂ සනාථ ලිපි යවනු ලබන අතර ශේෂ සනාථ කරන දිනය වන විට ණය පියවා ඇත්නම් 2024.12.31 දිනට ශේෂ සනාථ කර නොඑවීමක් බොහොමයක් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් විසින් සිදු කරනු ලබයි. ඒ අනුව මෙම දිස්ත්‍රික් අලෙවි නියෝජිතවරුන් විසින් පැවති ණය ශේෂ පියවීම කඩිනමින් සිදු කර ඇති අතර ශේෂ තහවුරු කර නොඑවන්නේ නම් එම ශේෂය නිවැරදි ශේෂය ලෙස සලකා ඉදිරි කටයුතු කරන බව ඔවුන් වෙත යවන ලද ලිපි මඟින් දන්වා ඇති හෙයින් එම ශේෂ නිවැරදි ශේෂ ලෙස සලකා කටයුතු කර ඇත.	වෙනසට හේතු පරීක්ෂා කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශේෂ සනාථන ලිපි එවා තිබූ අංක **A - 091** දරන අලෙවි නියෝජිතයාගේ ශේෂය ලෙස රු.963,000 ක් දක්වා ඇතත්, මණ්ඩලයේ ගිණුම්වල දක්වා තිබූ ශේෂය රු.596,292 ක් වීම හේතුවෙන් රු.366,708 ක වෙනසක් දක්නට ලැබුණි.		
(ඉ)	බැංකු ඇපකර හෝ වෙනත් සුරක්ෂණයන් රහිතව පැසිව් ලොතරැයිපත් විකිණීම සඳහා ලොතරැයි නියෝජිතයන් 41 දෙනකුට අවස්ථා සලසා දීම හේතුවෙන් එකී නියෝජිතයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයකර ගත යුතු රු.9,597,376 ක ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2024.12.31 දිනට මාස 03 ක් ඉක්මවූ ණය ශේෂය රු.9,597,376 ක් වන අතර මේ වන විට අය විය යුතු මුදල රු.5,278,110 කි. මෙම ණය ශේෂ සඳහා නීතිමය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.	මණ්ඩලය ණයට අලෙවි කරනු ලබන ලොතරැයිපත් අලෙවි වටිනාකම ආවරණය වන පරිදි ආරක්ෂිත ඇපකර ලබාගත යුතු අතර මණ්ඩලයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඊ)	බැංකු ඇපකර ලබාදී තිබූ පැසිව් ලොතරැයි අලෙවි නියොජිතයින් 30 දෙනකුගේ බැංකු ඇපකර වටිනාකම ඉක්මවා ණයට විකුණුම් සිදුකර තිබීම හේතුවෙන් ඇපකර වටිනාකම ඉක්මවා සිදුකර තිබූ රු.21,131,129 ක විකුණුම් මුදල් මණ්ඩලය වෙත අයකරගැනීමට නොහැකි වී තිබුණි.	බැංකු ඇපකර වලට අමතරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත විශේෂ දිනුම් වාර සඳහා ලොතරැයිපත් ණයට ලබා දෙනු ලබන අතර එසේ බැංකු ඇපකර වටිනාකම ඉක්මවා ලබා දෙනු ලබන ණය මුදලින් එක් ශේෂයක් හැර අනෙකුත් ණය මුදල් පියවා ඇත. එම ණයගැතියාද වාරික වශයෙන් ගෙවමින් පවතින අතර මේ වන විට ණය මුදල රු.1,773,408.55 කි.	වර්ථමානයේ සිදුකරන ණයට විකුණුම් වටිනාකම හා ඇපකර වටිනාකම සමාලෝචනය කර අවශ්‍ය සංශෝධනයන් සිදු කළ යුතුය.
(උ)	මණ්ඩලයේ සුභ සාධක සංගමය වෙත සහ කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වෙත ණය පදනම මත අලෙවි කර තිබූ සෙවන, සමෘද්ධි හා විශේෂ ලොතරැයි අලෙවියට අදාළ රු.1,086,759 ක් වසර 5 ක් ඉක්මවා හිඟව පවතින අතර අදාළ හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ජාතික ලොතරැයි මණ්ඩලයේ සුභ සාධක සංගමයට හා නිලධාරියෙකු වෙත ණය පදනම මත අලෙවි කර තිබූ වසර 5 ට වැඩි ණය ශේෂය රු.1,086,759.00 ක් වේ.	ලොතරැයි මිලදීගන්නා පාරිභෝගිකයින් සියළුම ලොතරැයිපත් අත්පිට මුදලට මිලදී ගන්නා බැවින් මණ්ඩලයට අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල නිලධාරියාට විරුද්ධව ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඌ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඩොලර් ෆෝචූන් ලොතරැයියට අදාළව හිඟව පවතින රු.964,678 ක් හා කොලම්බු එයාපෝට් සුපර් ඩ්‍රෝර් ලොතරැයියට අදාළව හිඟව පවතින රු.4,150,280 ක් අයකර ගැනීම සඳහා අදාල අලෙවි නියෝජිතයන්ට එරෙහිව ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි .	කලම්බු එයාර්පෝර්ට් සුපර් ඩ්‍රෝ ලොතරැයියට අදාළ හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා පවත්වාගෙන යන අතර සිවිල් නඩුවක් පැවරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඩොලර් ෆෝචූන් ලොතරැයියේ හිඟව පවතින මුදල් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2024/03/11 දිනැති කමිටු වාර්තාව නීතිමය කටයුතු ආරම්භ කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලෙස දන්වා ණය අය කර ගැනීමේ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.	හිඟ මුදල් අය කර ගැනීම සඳහා අප්‍රමාදව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.
(එ)	විධිමත්ව අත්සන් කරන ලද ගිවිසුමකින් තොරව අලෙවි නියෝජිත අංක **A-**202 වෙත සිදුකරන ලද ණයට විකුණුම් වෙනුවෙන් රු. 1,234,775 ක් වසර 3ත් -5ත් අතර කාළයක සිට හිඟව පවතින අතර හිඟ මුදල් අය කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් හා යෝග්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	එකඟ වේ. 2017 පෙබරවාරි 20 දින සිට 2019 අගෝස්තු මස 20 දින දක්වා වූ ගිවිසුමේ මණ්ඩලය වෙනුවෙන් අතිරේක සාමාන්‍යාධිකාරිගේ අත්සන යොදා නොමැත. සොනෙල්ටා හොල්ඩින් පුද්ගලික සමාගම (A202) වෙනුවෙන් පවත්නා ණය මුදල් වෙනුවෙන් මේ වන විට නීතිමය කටයුතු ක්‍රියාත්මක කර ඇත.	හිඟ මුදල් අය කර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතුය.
(ඒ)	මණ්ඩලයේ සේවය කළ නිලධාරින් 5 ක් වෙත ලබා දී තිබූ ආපදා ණය මුදල්වලින් එකතුව රු.713,393.54 ක් වූ ණය ශේෂ 2012, 2017, 2018 සහ 2019 වර්ෂවල සිට ආපසු ගෙවීම අදාළ නිලධාරින් විසින් පැහැර හැර ඇතත් එකී අයවිය යුතු ණය ශේෂ වර්ෂාවසානය දක්වා අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	මෙම ණය සම්බන්ධයෙන් සමාලෝචනය කර වාර්තාවක් ණය අයකර ගැනීමේ කමිටුව වෙත යොමු කොට අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කරන ලදී.විගණන හා කලමනාකරණ රැස්වීමට හා අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලට මෙම කරුණ පිළිබඳව දැනුවත් කිරීම සිදුකර ඇත. ඒ අනුව මෙහි සඳහන් හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට මූලික පියවරක් ලෙස ලියාපදිංචි තැපෑලෙන් එන්තරවාසි යවා ඇත. ඉන් පසු සමථ මණ්ඩලයට යොමුකොට විසඳාගැනීමට නියමිතය.	හිඟ මුදල් අය කර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය.
(ඔ)	මණ්ඩලයේ සේවය කළ නිලධාරින් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ නිවාස ණය මුදල්වලින් එකතුව රු.1,518,204 ක් වූ ණය ශේෂ දීර්ඝ කාලයක සිට ආපසු ගෙවීම පැහැර හැර ඇතත්, එකී ණය	2024 වර්ෂය තුල රු.1,316.18/-ක මුදලක් පියවීමට කටයුතු කර ඇති අතර මේ වන විට ශේෂය රු.1,518,204/- ක් වේ.	හිඟ මුදල් අය කර ගැනීම සඳහා දේපල ඇප මත නෛතික ක්‍රියා මාර්ග ගත යුතුය.

මුදල් අය කර ගැනීමට හෝ ඇප තබා ඇති දේපල සම්බන්ධයෙන් හෝ නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 10 (5) වගන්තිය හා 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 17(2) වගන්තිය	ලොතරැයි ආදායමෙන් පනතේ නිශ්චිතව දක්වා ඇති වියදම් අඩුකළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ලාභ එකතුව වූ රු.**4**,040,535,807 ක් එලෙස ඒකාබද්ධ අරමුදලට බැර කිරීමෙන් තොරව, මණ්ඩලය තුළ රඳවා ගෙන තිබුණි.	මුදල් අමාත්‍යාංශය විසින් යොමු කරන ලද විශේෂ ඉල්ලීම මත රු.මිලියන 410 ක්ද 2023 වර්ෂයේ මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ලාභය වූ රු.මිලියන 650 ක්ද සමග රජයේ ඒකාබද්ධ අරමුදලට රු.මිලියන 1,060ක් බැර කර ඇත. තවද 2024 වසරට අදාළ ලාභය රජයේ අවශ්‍යතාවය පරිදි ඉදිරියේදී ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.	අදාල පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය.
(ආ)	1963 අංක 11 දරන මුදල් පනතේ 16(4) හා 1997 අංක 35 දරන සංශෝධන පනතේ(4) 4 සහ 5 (4)වගන්තිය	මණ්ඩලය විසින් පවත්වන ලද සෑම ජාතික ලොතරැයි දිනුම් ඇදීමකින්ම එසේ දිනුම් අදිනු ලැබූ දින සිට මාස හයක කාලයක් ඉකුත්වීමෙන් පසුව ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රාජසන්තක කරනු ලැබිය යුතු අතර එම ත්‍යාග වටිනාකම ඒකාබද්ධ අරමුදලට බැර තළ යුතුය. ඒහෙත්, ලොතරැයි වර්ග 05 ක මාස 06 ක් ඉක්ම වූ හිමිකම් නොපෑ රු.76,501,720 ක අහිමි කළ විශේෂ මුදල් ත්‍යාග ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.	මෙම විශේෂ පාරිභෝගික ප්‍රවර්ධන ත්‍යාග රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර නොකිරීම සම්බන්ධයෙන් කරුණු ඇතුළත් ජාතික ලොතරැයි මණ්ඩලයේ රීති පළ කරන ලද අංක 2387/37 දරණ විශේෂ ගැසට් නිවේදනයක් 2024 ජුනි 06 දින ප්‍රකාශයට පත් කර ඇත.	පනතේ විධි විධාන අනුව මණ්ඩලය විසින් පවත්වන සෑම ලොතරැයි දිනුම් ඇදීමකින් ප්‍රදානය කරණ ත්‍යාගවලින් මාස 06 ඇතුළත හිමිකම ඇති තැනැත්තා ඉදිරිපත් නොවූ සියළු මුදල් ත්‍යාග රාජසංතක කර ඒකාබද්ධ අරමුදලට ලබාදිය යුතුය.
(ඇ)	2019 දෙසැම්බර් 17 දිනැති අංක 2019/08 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය	2019 වසරේ සිට රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය	ජාතික ලොතරැයි මණ්ඩලය www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වාදී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (E-GP) යටතේ ලියාපදිංචි වී ඇති අතර මේ වන විට විද්‍යුත් රාජ්‍ය	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.

		ප්‍රසම්පාදන ක්‍රමවේදය (E – GP) යටතේ කටයුතු කළ යුතු වුවත්, එම ක්‍රමවේදය යටතේ මණ්ඩලයේ කිසිදු ප්‍රසම්පාදනයක් සිදු කර නොතිබුණි.	ප්‍රසම්පාදන ක්‍රමවේදය (E -GP) යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇත.	
(ඇ)	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	ඉන්ධන දීමනා හිමිකම් නොමැති පහළ මට්ටමේ කළමනාකරුවන් (JM 1-1) 21 දෙනෙක් සඳහා ලීටර් 110 බැගින් මාසිකව ඉන්ධන දීමනා, නිලධාරින් 22 දෙනෙක් සඳහා රු.35,000 බැගින් ප්‍රවාහන දීමනා, කළමනාකරණ සහකාර (MA 1-2) නිලධාරීන් 15 දෙනෙකු සඳහා ලීටර් 25 බැගින් මාසිකව ඉන්ධන දීමනා හා නිලධාරින් 05 ක් සඳහා රු.6,000 බැගින් ප්‍රවාහන දීමනා ගෙවීම සඳහා ගිණුම් වර්ෂය තුළ රු.10,690,970 ක් වැය කර තිබුණි.	ජාතික ලොතරැයි මණ්ඩලයේ කාර්ය භාරය ඉදිරියටත් පවත්වාගෙන යාම සහ එහි අලෙවිය සාක්ෂාත් කර ගැනීම සඳහා වාර්තමානයේ අනුගමනය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රවාහන ක්‍රමය ඉදිරියට ද අනුගමනය කරන බව කාරුණිකව දන්වමි. මෙම ප්‍රවාහන ක්‍රමයට අනුමැතිය ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්ගෙන් දැනට ඉල්ලීමක් සිදුකර ඇති අතර ජාතික ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන්ගේ රාජකාරි වගකීම් වලට කිසිසේත්ම නොගැලපෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 මත පදනම්ව ලොතරැයි මණ්ඩලය පවත්වාගෙන යා නොහැකි බව කාරුණිකව දන්වමි.	ජාතික ලොතරැයි මණ්ඩලය වෙනුවෙන් වෙනම ප්‍රවාහන සහ ඉංධන දීමනා ක්‍රමයක් අනුමත කරගන්නා තෙක් දැනට ඒ සඳහා ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූල විය යුතුය .
(ඉ)	2015 මැයි 25 දිනැති අංක PED 2/2015 සහ 2022 ජනවාරි 18 දිනැති අංක PED 2/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4 වගන්තිය.	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන සේ මණ්ඩලයේ හිටපු සභාපති ඇතුළු නිලධාරින් 19 ක් වෙත රු.1,873,664.33 ක් වටිනා ජංගම දුරකතන 23 ක් සහ රු.436,600 ක් වටිනා i pad 06 ක් ලබාදී තිබුණි. අතර හිටපු අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු වෙත ලබාදී තිබු රු. 282,657 ක් වටිනා i pad එකක් සහ Macbook එකක් මේ දක්වා මණ්ඩලය වෙත භාරදී නොතිබුණි.	වසර ගණනාවක සිටම මධ්‍යම මට්ටමේ සිට ඉහළ නිලධාරීන්ට රාජකාරි කටයුතු සඳහා ජංගම දුරකථන, මණ්ඩලය විසින් මිලදී ගෙන ලබා දී තිබූ අතර කොරෝනා වසංගත සමයතුළදී එම අවශ්‍යතාවය ඉහළ යාමක් සිදුවී ඇත. ඒ අනුව, එකී කටයුතු යම්කිසි පාලනයකට ගෙනඒම උදෙසා 2022 වර්ෂයේදී එම ක්‍රමවේදයට සංශෝධනයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මගින් සිදුකර තිබුණි. හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ සම්බන්ධයෙන් නීති කටයුතු ආරම්භ කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කල යුතුය.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006

(i)	3.6 වගන්තිය	මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ දින සිට මාස 6 ක් ඉකුත් වී නොමැති අතිරේක භාණ්ඩ අවශ්‍යතාවය කලින් නොදුටු සහ හඳුනාගෙන නොතිබුණු විශේෂ අවස්ථාවලදී පමණක් එම කොන්ත්‍රාත්තුවේ දිගුවක් ලෙස නැවත ඇනවුම්ක් සිදු කළ හැකි වුවත්, මණ්ඩලය විසින් 2019 වර්ෂයේ සිට අවස්ථා ගණනාවකදී ලොතරැයි පත් මුද්‍රණයට අදාල ප්‍රසම්පාදනයේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.	ප්‍රසම්පාදන කටයුතු සිදු කරගෙන යාමේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු සහ ප්‍රසම්පාදන අස්ථිරත්වය වෙත පාලනය කළ නොහැකි කරුණු හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අවසන් කිරීමට සැලකිය යුතු කාල සීමාවක් ගත වී ඇති අතර එම කාල සීමාවන් තුළ වෙළඳපොළ වෙත බාධාවකින් තොරව අඛණ්ඩව ලොතරැයිපත් සැපයීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඒ වන විට ලොතරැයිපත් මුද්‍රණය කරන ලද මුද්‍රණ ආයතන සමඟ පැවති කොන්ත්‍රාත් ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට හෝ අන්තර්කාලීන ප්‍රසම්පාදනයක් සිදු කිරීම තුළින් ලොතරැයිපත් මුද්‍රණයකර ගැනීමට කටයුතු කර ඇත.	පූර්ව ප්‍රසම්පාදනය යටතේ තෝරාගත් සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත් කාලය අවසන් වන විට නව සැපයුම්කරුවකු ඒ සඳහා තෝරා ගත හැකිවන පරිදි ප්‍රසම්පාදන කටයුතු නිවැරදිව සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුය.
(ii)	4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය	අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කරගත යුතු වුවත්, 2019 සිට 2024 දක්වා මණ්ඩලයේ ලොතරැයිපත් මුද්‍රණයට අදාල ප්‍රසම්පාදන කාර්යයන් ඇතුළත් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අනුමත කර නොතිබුණි.	2025, 2026, 2027 වර්ෂ සඳහා වූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුම හා 2025 වර්ෂය සඳහා වූ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම සඳහා 3883(14) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.

(iii)	4.4 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ එක් ප්‍රසම්පාදනයක් යටතේ සිදුකළ හැකිව තිබූ රු.22,974,600 ක් වටිනා අලෙවි සහයක ටී ෂර්ට් 20,000 ක්, රු.3,825,000 ක් වටිනා අලෙවි නියෝජිත ටී ෂර්ට් 3,000 ක් සහ රු.1,386,750 ක් වටිනා කාර්ය මණ්ඩල ටී ෂර්ට් 1,075 ක් මිලදී ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.	උක්ත ප්‍රසම්පාදනයන් වසර දෙකකට අදාළ ප්‍රසම්පාදන සැලසුම් 02 ක් යටතේ හා එකිනෙකට වෙනත් තාක්ෂණික පිරිවිතරයන් 03 ක් යටතේ කාලපරිච්ඡේදයන් 03 ක් වෙනුවෙන් ප්‍රසම්පාදනයන් 03ක් යටතේ ක්‍රියාත්මක කිරීම සිදුකරන ලද බව දන්වා සිටිමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.
(උ)	2023 ජනවාරි 30 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 009/601/0199/23 හා 2023 පෙබරවාරි 07 දිනැති අංක 009/601/0199/123 දරන අමාත්‍ය මණ්ඩල තීරණය	රජයේ ආයතනවල නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නීතිඥවරුන්ගේ සේවය පමණක් ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත්, මණ්ඩලයට එරෙහිව ණ ආයතනයක් විසින් මුද්‍ර පවරා තිබූ නඩුවක් වෙනුවෙන් පෙනී සිටීම සඳහා පෞද්ගලික 06 නීතිඥවරු දෙනෙකුගේ සේවය ලබාගැනීම සඳහා රු. 5,314,650ක් වැය කර තිබුණි.	විගණකාධිපති නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.	අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.37,983,206,760 ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ රු. 32,014,201,280 ක් වූයෙන් ආදායම රු.5,969,005,480 කින් හෙවත් සියයට 18.64 කින් වැඩි වී තිබුණි. කෙසේවුවද, ප්‍රවර්තන වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.4,284,008,555 කින් ද, එකතුකළ අගය මත බදු හා සමාජ ආරක්ෂණ දායක බදු රු.615,311,886 කින් සහ පරිපාලන වියදම් රු.71,254,399 කින් වර්ධනය වීම නිසා සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.1,693,267,855 ක් වූ අතර එය මණ්ඩලයේ මුළු ආදායමින් සියයට 4.45 ක අඩු අගයක් වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මණ්ඩලයේ 2024 වර්ෂයේ සහ 2023 වර්ෂයේ විකුණුම්, අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්, පරිපාලන වියදම් සහ මූල්‍ය හා අනෙකුත් වියදම් කාණ්ඩයන්ට අදාළ වියදම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

විස්තරය	වර්ෂය 2024 (රු.)	2023 (රු.)	වෙනස රු.	වෙනස ප්‍රතිශතයක් ලෙස
විකුණුම්, අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම්	1,158,486,156	1,408,116,521	249,630,365	17.73 %
පරිපාලන වියදම්	1,128,174,614	1,056,920,215	71,254,399	6.74 %

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ විකුණුම්, අලෙවිකරණ හා බෙදාහැරීමේ වියදම් සියයට 17.73 කින් අඩු වී තිබූ අතර පරිපාලන වියදම් සියයට 6.74 කින් වැඩිවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායීත්ව සහ කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

	අනුපාතය	වර්ෂය 2024	2023	වෙනස %
(i)	දළ ලාභ අනුපාතය (සියයට)	8.01	6.3	1.71
(ii)	ශුද්ධ ලාභ අනුපාතය (සියයට)	3.96	2.03	1.93
(iii)	ජංගම වත්කම් අනුපාතය (වාර ගණන)	2.38:1	2.44:1	-0.06
(iv)	ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන)	2.37:1	2.42:1	-0.05

මණ්ඩලයේ ප්‍රවර්තන වර්ෂයේ දළ ලාභ සහ ශුද්ධ ලාභ අනුපාතයන් පිළිවෙලින් සියයට 8.01 ක් සහ සියයට 3.96 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් සියයට 6.3 ක් සහ සියයට 2.03 ක් විය. ඒ අනුව, ප්‍රවර්තන වර්ෂයේදී දළ ලාභ සහ ශුද්ධ ලාභ අනුපාතයන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 1.71 කින් සහ සියයට 1.93 කින් වර්ධනය වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් ආයතනික සම්පත් කළමණාකරණ මෙහෙයුම් පද්ධතියක් (**ERP System**) ස්ථාපිත කිරීමේ සමාරම්භක උත්සවයේ වියදම් ලෙස හෝටල් පරිශ්‍රයක් වෙනුවෙන් සහ ආහාර පාන වියදම් ලෙස රු.361,550 ක් වැයකර තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව උක්ත සමාරම්භක උත්සවයේ වැඩ කටයුතු රු.361,550 ක පිරිවැයකට කොළඹ ප්‍රදේශයේ රජයට අනුබද්ධ රාජ්‍ය හෝටල් සංස්ථාව යටතේ ක්‍රියාත්මක වන සමුද්‍ර හෝටල් පරිශ්‍රයේ පැවැත්වීමට කටයුතු සිදු කර ඇත.	ආයතනයේ අරමුදල් වැය කිරීමේදී රාජ්‍ය මුදල් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රතිපාදන අදාල කර ගත යුතුය.
(ආ)	භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන මුදල් සම්බන්ධ ආදායම් බදු ගැටළුවක් මුල්කරගෙන මණ්ඩලය විසින් දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත බැංකු ඇපකර ඉදිරිපත් කිරීමට සිදුවීමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,968,549 ක් බැංකු ඇපකර	2017/2018 සඳහා වූ බදු අභියාචනය දැනට කොමිෂන් සභාව මඟින් අදාළ විමසීම් කටයුතු සිදු කරමින් පවතින අතර එහි තීන්දුව ලබාදීමට ගතවන කාලය සම්බන්ධයෙන් මණ්ඩලයට කිසිවක් ප්‍රකශ කල නොහැකි බව දන්වා සිටිමු.ඉහත ගැටලුව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ	මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදලට ලබාදෙන දායකත්වය අදායම් බදු ගණනය කිරීමේදී ඉඩ දෙන ආකාරය සම්බන්ධ යෙන් දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව

ගාස්තු ලෙස ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදී ඇපකර ගාස්තු ලෙස රු.16,178,698 ක් ගෙවා තිබුණි. ලොතරැයි අලෙවි ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට ලබාදෙන දායකත්වය සඳහා ඉඩදීම සම්බන්ධයෙන් මෙම ගැටලුව පැන නැගී තිබූ අතර මණ්ඩලය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශ අතර එකඟතාවයකට නොපැමිනීම හේතුවෙන් අනවශ්‍ය බැංකු ගාස්තු පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.	මැදිහත්වීමක් ලබාගැනීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශය වෙත අවස්ථා කිහිපයකදී ලිඛිතව හා වාචිකව ඉල්ලීම් සිදුකර ඇත.	සමඟ එකඟතාවයක් ඇති කර ගත යුතුය.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 අප්‍රේල් 01 දින සිට ලොතරැයි වර්ග 5 ක් මුද්‍රණය කරවා ගැනීමට සිදු කල ප්‍රසම්පාදනයේදී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා මාස 6 1/2 ක් ප්‍රමාද වීම හේතුවෙන් වෙනත් හදිසි ප්‍රසම්පාදනයන් මගින් මුද්‍රණය කරවා ගැනීමට සිදු වී තිබුණි. ඒ හේතුවෙන් ආසන්න වශයෙන් රු. 48,567,542 ක වළක්වා ගත හැකිව තිබූ අමතර පිරිවැයක් දැරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.	මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා එහි වාර්තාව ලැබී ඇත. ඒ අනුව ඉදිරියේ දී මේ සඳහා සවිස්තරාත්මක පිළිතුරක් යොමු කිරීමට බලාපොරොත්තු වන බව මෙයින් දන්වනු කැමැත්තෙමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සැලසුම් කළ කාලය තුළ ප්‍රසම්පාදන කාර්යය නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	ක්ෂණික (සුරන) ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේ කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමට මාස 6 ක් ප්‍රමාද වීම හේතුවෙන් කලින් සිටි සැපයුම්කරුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදුවී තිබුණි.ඒ හේතුවෙන් ආසන්න වශයෙන් රු.5,437,500 ක වලක්වා ගත හැකිව තිබූ අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	2022 වර්ෂයේ සිදු වූ ආර්ථික පසු බැසීම හේතුවෙන් ඇති වූ ආනයන සීමා වීම් හා විනිමය ප්‍රේෂණ ගැටළු හේතුවෙන් මුද්‍රණ ක්ෂේත්‍රයට බලපෑ මුද්‍රණ කඩදාසි හිඟය හා අනෙකුත් මුද්‍රණ අමුද්‍රව්‍යයන්ගේ හිඟතාවය හේතුවෙන් 2022 වර්ෂයේ ආරම්භ කරන ලද ප්‍රසම්පාදනයේ සුදුසුකම්ලත් මුද්‍රණ සැපයුම්කරුවෙකු තෝරා පත් කර ගන්නා තෙක් පවත්නා මුද්‍රණ සැපයුම්කරුගේ මුද්‍රණ කොන්ත්‍රාත් ගිවිසුම් කාලය මාස 06 කින් දීර්ඝ කිරීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සිදු කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සැලසුම් කළ කාලය තුළ ප්‍රසම්පාදන කාර්යය නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඇ)	නිවැරදි පුරෝකතන දත්තයන් මත ලොතරැයි මුද්‍රණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2024 වර්ෂය තුල මුද්‍රණය කල ටිකට්පත් අතුරින් ටිකට්පත් 20,241,950 ක් නියෝජිතයින් වෙත බෙදාහැරීමකින්	විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි 2024 වසර තුල ලොතරැයිපත් 1,072,546,400ක් මුද්‍රණය කර ඇති බවත් ඉන් ටිකට්පත් 20,241,950 ගබඩාවේ ඉතිරිව පවතින බවත් ටිකට්පත් 110,972,541 ක ප්‍රමාණයක්	වැඩි පුර ලොතරැයිපත් මුද්‍රණය කිරීමෙන් අනවශ්‍ය මුද්‍රණ පිරිවැයක් මෙන්ම අනවශ්‍ය ප්‍රවාහනය

තොරව ගබඩාවේ ඉතිරි වී තිබුණි. එසේම ටිකට්පත් 110,972,541 ක් නියෝජිතයින් විසින් හරවා එවා තිබුණි. මෙලෙස නිසි පුරෝකතනයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් ආසන්න වශයෙන් රු.106,945,990 ක වලක්වා ගත හැකිව තිබු මුද්‍රණ පිරිවැයක් හා ප්‍රවාහන පිරිවැයක් දැරීමට මණ්ඩලයට සිදුව තිබුණි.	ආපසු එවීම් වන බව පෙන්වා දී ඇත. නමුත්, මෙම දත්ත වල නිරවද්‍යතාවයේ යම් ප්‍රායෝගික ගැටළුවක් පවතී. මේ තුල මුද්‍රණය නොකරන SMS ලොතරැයිපත් සඳහා දත්ත පද්ධතියෙන් වෙන් කරන ලොතරැයිපත් ද ඇතුළත්ව පවතී.	පිරිවැයක් වැයවන බැවින් හැකි තාක් නිවැරදි දත්ත මත ලොතරැයිපත් මුද්‍රණය කිරීම සඳහා කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීවයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් 2023 ජූලි 06 දින සිට එතෙක් රු. 20 ට අලෙවිකල ලොතරැයිපතක මිල රු. 40 ක් දක්වා සියයට 100 කින් වැඩිකර තිබුණි. ලොතරැයිපතක මිල වැඩි කිරීමට පෙර ආසන්න වර්ෂය තුළ අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමානය 1,298,009,942 ක් වූ අතර මිල වැඩි කිරීමෙන් පසු 2024 වර්ෂය තුළ අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමානය 821,763,940 ක් වීම හේතුවෙන් මිල වැඩි කිරීමෙන් පසු අලෙවි කර තිබූ ලොතරැයිපත් ප්‍රමාණය 476,246,002 න් හෙවත් සියයට 37 න් පහත වැටී තිබුණි.	අනෙකුත් පාරිභෝගික භාණ්ඩ හා සේවාවන් සමඟ සැසඳීමේදී ලොතරැයිය යනු පාරිභෝගිකයාට අත්‍යාවශ්‍යම දෙයක් නොවේ. නමුත් ලොතරැයි පාරිභෝගිකයා තුල ජයග්‍රහණය පිළිබඳ බලාපොරොත්තු ඉස්මතු කරමින් අලෙවි කරනු ලබන භාණ්ඩයක් වන අතර කිසිවිටකත් එය පරිභෝජනය අහිමි වීම මත එම පාරිභෝගිකයන්ට කිසිදු උපයෝගීතාවයක් අහිමිවීමක් සිදු නොවේ. එවැනි තත්වයක් තුළ ලොතරැයි පාරිභෝගිකයා ලොතරැයි වෙනුවෙන් තම ආදායමෙන් වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණය අනෙකුත් අවශ්‍යතා කැප කරමින් වියදම් කරන අයුරින් පාරිභෝගික හැසිරීමක් බලාපොරොත්තු විය නොහැක.	මණ්ඩලයේ ලොතරැයි අලෙවිය වර්ධනය කර ගැනීමට අවශය පියවර ගත යුතුය.

(ආ)	කලාප භාර නිලධාරින්ගේ නිර්දේශ මත අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට සිදුවන ආපදාවලදී ප්‍රතිලාභ ලෙස රු.14,871,500 ක් අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහයකයින්ට ලබාදී තිබුණි. මෙම ප්‍රතිලාභ ලබන අලෙවි සහයකයින් සමඟ මණ්ඩලයට සෘජු බැඳීමක් නොමැතිවීමත් ඔවුන් සම්බන්ධ තොරතුරු ලේඛන ගත නොවීමත් ලොතරැයි විකිණීම සඳහා ප්‍රමාණවත් කොමිස් මුදලක් වෙන්කර තිබීමත් මෙවැනි ගෙවීමක් සඳහා පනත තුළ ප්‍රතිපාදන ඇතුළත් නොවීමත් හේතුවෙන් මෙම යෝජනා ක්‍රමය නීත්‍යානුකූල නොවන ලෙස ක්‍රියාත්මක වී ඇති බව හා ප්‍රතිලාභ ලබාදීමේදී අක්‍රමිකතා ඇතිවීමේ අවදානමක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය.	2015 අප්‍රේල් 01 වන දින සිට 2017 මාර්තු 31 දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදය යටතේ ලබා දෙන ලද ප්‍රතිලාභ ප්‍රමාණයට වඩා වැඩි ගෙවීමක් රක්ෂණ සංස්ථාව වෙත ගෙවීම් කිරීමට සිදු වීම හේතුවෙන් අදාල ක්‍රමවේදය වෙනුවට අලෙවි ජාලය වෙත සෘජුව ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදයක් ආයතනය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.	අලෙවි නියෝජිතයින්ගේ සහ අලෙවි සහයකයින්ගේ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාමට සහ ප්‍රතිලාභ ලැබිය යුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගැනීමට අවශ්‍ය පාලන ක්‍රම වැඩි දියුණු කළ යුතු අතර යෝජනා ක්‍රමය නීත්‍යානුකූල ලෙස සිදුකළ යුතුය.
(ඇ)	මණ්ඩලය විසින් කිසිදු නෛතික ප්‍රතිපාදනකින් තොරව 2024 වර්ෂයේ අලෙවි සහයක මරණ 86 ක් වෙනුවෙන් රු.9,700,000 ක් ගෙවා තිබූ අතර එම මුදලින් රු.2,000,000 ක් පුද්ගලයන් 9 දෙනෙකුගේ හදිසි මරණ වෙනුවෙන්ද, රු.7,700,000 ක් පුද්ගලයන් 77 දෙනෙකුගේ ස්වාභාවික මරණ වෙනුවෙන්ද ගෙවා තිබුණි.	විගණකාධිපතිගේ නිරීක්ෂණය සමඟ එකඟ වේ.	අලෙවි සහයක සුභසාධන කාර්යයන් අලෙවි නියෝජිතයන් විසින් සිදු කල යුතුය.
(ඈ)	විවිධ රෝගවලින් පෙළෙන මහජනයාට ප්‍රතිකාර සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ අරමුණින් ලොතරැයි අලෙවි ආදායමෙන් සියයට 0.005 ක ප්‍රමානයක් බැර කර සකස් කර තිබූ අසරණ සරණ අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.17,689,632 ක් වැය කර තිබූ අතර ඉන් රු.16,041,132 ක් එනම් සියයට 90 ක් එම අරමුදල පිහිටුවීමේ අරමුණුවලට පටහැනි වෙනත් කාර්යයන් සඳහා වැය කර තිබුණි.	අසරණ සරණ අරමුදල වෙත අරමුදල් සම්පාදනය කිරීම ලොතරැයි ජයග්‍රාහකයින්ගේ කැමැත්ත මත ප්‍රදානය කරනු ලබන පරිත්‍යාගයන්, ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් දිරි දීමනාවන්ගෙන් ප්‍රදානය කරනු ලබන දායකත්වයන් (උදා - නීරෝගා ලොතරැයිය) ඇසුරින් සිදු කර ඇත. මෙම අරමුදල 1998.10.08 වන දිනැති අංක 3551 - 2 දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කරන ලදී.	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව මෙවැනි අරමුදල් පවත්වා ගැනීම නොකළ යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනුරාධපුර සංචාරක නිකේතනයේ වර්ෂයක් තුළ උපයෝජනය කළ හැකි කාමර සංඛ්‍යාව 2,555 ක් වුවත් 2023 වර්ෂයේදී කාමර 338 ක් සහ 2024 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු 31 දක්වා කාමර 254 ක් පමනක් උපයෝජනය කර තිබුණි. එමෙන්ම මන්නාරම සංචාරක නිකේතනයේ වර්ෂයක් තුළ උපයෝජනය කළ හැකි කාමර සංඛ්‍යාව 1,825ක් වුවත් 2023 වර්ෂයේදී කාමර 101 ක් සහ 2024 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු 31 දක්වා කාමර 70 ක් පමණක් උපයෝජනය කර තිබුණි.	මීට වසර 30 කට පමණ පෙර ඉදි කරන ලද අනුරාධපුර සංචාරක නිකේතනය මේ වන විට පූර්ණ අළුත්වැඩියාවකට භාජනය කල යුතු තත්වයේ පවතී. එම හේතුව කාමර වෙන් කිරීම් අඩු වීමට බලපා ඇත. මන්නාරම සංචාරක නිකේතනය පිහිටා ඇත්තේ සංචාරකයන් පැමිණීම ඉතා අවම මට්ටමක පවතින ප්‍රදේශයක වීම එම සංචාරක නිකේතනයේ කාමර වෙන් කිරීම් අඩු වීමට ප්‍රධාන හේතුව වී ඇත.	සංචාරක බංගලාවල අඩුපාඩු නිවැරිදි කර පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	මණ්ඩලය සතු වාහනවලින් ට්‍රක් රථ 05 ක්, වෑන් රථ 03 ක් සහ මෝට බයිසිකල් 02 ක් වර්ෂ 03 කට අධික කාලයක සිට ධාවනය කර නොතිබූ අතර එම වාහන මණ්ඩලය සතු වෝක්ෂෝල් ඉඩමේ රථ ගාලේ එළිමහනේ ගාල් කර තිබුණි. මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන්නේ නම් අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.	Mitsubishi Canter වර්ගයට අයත් ට්‍රක් රථය අළුත්වැඩියා සඳහා ප්‍රසම්පාදන කටයුතු නිමකර අළුත්වැඩියාවට යොමු කිරීමට නියමිතව ඇති අතර, අනෙකුත් ට්‍රක් රථ 04 හා වෑන් රථ 03 ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් විකිණීමට සූදානම් කරමින් පවතී. යතුරුපැදි දෙකක් ඇති අතර එම යතුරුපැදි දෙක ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ලබා දීමට සූදානම් කර ඇත.	මන්ඩලයට ආර්ථික වශයෙන් වාසිදායක තීරණයක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	ලොතරැයි දිනුම් ඇදීමේ කටයුතු මෙහෙයවීම සඳහා සමාගමක් වෙතින් මිලදී ගෙන තිබූ **Fortune** පරිගණක පද්ධතිය නඩත්තුව සඳහා එළඹී තිබූ ගිවිසුම 2015 වර්ෂයේ සිට නතර කර තිබීම හේතුවෙන් මණ්ඩලයට ආපසු එවනු ලබන ලොතරැයිපත් ප්‍රමාණය වැඩිවන විට මෙම පද්ධතියේ ක්‍රියාකාරිත්වය දුර්වල වීම හා පද්ධතිය මඟින් මුද්‍රණය කරන ආපසු එවුම් ඉන්වොයිස්පත්වල අඛණ්ඩව දෝෂ පැවැතීම සිදුව තිබුණද, එම දෝෂ මේ දක්වා නිවැරදි කිරීමට නොහැකි වී තිබුණි.	මෙම පද්ධතිවල මූලික මූලාශ්‍ර කේතයන් ජාතික ලොතරැයි මණ්ඩලය සතු නොවන බැවින් ඇතැම් දෝෂයන් මේවන විටත් පූර්ණ වශයෙන් නිවැරදි කිරීමට නොහැකි වී ඇති අතර එම ගැටළු මතුවූ අවස්ථාවන් හිදී මණ්ඩලීය තොරතුරු තාක්ෂණ අංශය මගින් විසඳුම් ලබාදීම සිදු කරනු ලබයි.	දුර්වලතා නිරීක්ෂණය වන විට පද්ධතියේ අවශය සංවර්ධනයන් සිදුකළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ලොතරැයි මණ්ඩලයේ දැන්වීම් ප්‍රචාරණය කිරීම සඳහා 2024/2025 වර්ෂයට අදාළ ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරාගැනීම අදාල ප්‍රසම්පාදන කටයුතු මෙම වාර්තාව නිකුත්කරන දිනය දක්වා අවසන් කර නොතිබුණි.	2023/2024 දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතන තෝරා ගැනීම සඳහා සිදු කරනු ලැබූ ප්‍රසම්පාදනයේ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයට අනුව අවසන් අදියරෙන් දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතන	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරමින් නියමිත කාලය තුළ ප්‍රසම්පාදන කාරයයන්

		03ක් තෝරා පත් කර දීම සිදු කර එම නිර්දේශය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. එම නිර්දේශය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ උපදෙස් වූයේ සිදු කර ඇති ප්‍රසම්පාදනය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කාර්යයක් හා සමාන වන බවත්ය. මේ නිසා එය ප්‍රසම්පාදනයක් නොවන බවත් මූලික සුදුසුකම් ලැබූ (පූර්ව සුදුසුකම්ලත්) දැන්වීම් ප්‍රචාරණ නියෝජිත ආයතන 06 ද ඇතුලත්ව සැපයුම්කරුවන් තෝරා ගනිමින් දැන්වීම් ප්‍රචාරණ කටයුතු සිදු කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම සිදුකර ඇත.	නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	මණ්ඩලයේ කාර්යාල ඉඩ අවශ්‍යතාවය ව.අ. 40,000 ක් පමන වුවත්, අංක 32 , මුදලිගේ මාවතේ වර්තමාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ ප්‍රමාණය ව.අ. 28,885 ක් විය. මෙම ගොඩනැගිල්ල වසර 2 ක් සඳහා පමනක් කුළියට ගැනිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇතත් අවශ්‍යතාවයට ගැලපෙන වෙනත් ගොඩනැගිල්ලක් සපයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමකින් තොරව 2018 සැප්තැම්බර් 01 දින සිට වසර දෙකෙන් දෙකට කුළි ගිවිසුමේ කාලය දීර්ඝ කර ගනිමින් මෙම ගොඩනැගිල්ල භාවිතයට ගෙන තිබුණි.	මණ්ඩලයට ගොඩනැගිල්ලක් සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන කාර්යයන් හෝ ඍජු මිලදී ගැනීම් ක්‍රමවේදයන් කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක වුවත් ප්‍රායෝගික තත්වයන් යටතේ මෙම ගොඩනැගිල්ල කාර්යාල කටයුතු සඳහා භාවිතය සඳහා වසරක හෝ දෙකක කාලයක් සඳහා විටින් විට බදු ගිවිසුම දීර්ඝ කර ඇත. ගොඩනැගිල්ල භාවිත කළයුතු කාලය නිශ්චිතව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට තිබූ අපසුතාවය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකිවි ඇත. කෙසේනමුත් මණ්ඩලයේ කාර්යාල කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් හා ඉඩ ප්‍රමාණය සහිත ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා 2025 වර්ෂයේ සිට අඛණ්ඩව කටයුතු කර ඇත.	මණ්ඩලයේ ව්‍යාපාරික ස්ථානය අධික කුලියක් යටතේ පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කල යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් 2024 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබූ කාර්යන්වල ප්‍රගතිය භෞතිකව සහ මූල්‍යමය ලෙස කාර්තු වශයෙන්, අර්ධ වාර්ෂිකව සහ වාර්ෂිකව මැන බැලීම සිදුකළ යුතු වුවත්, එම කාර්යන්වල කාර්ය සාධනය මැන බැලීම සඳහා වසර අවසානයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.	සෑම වසරකම අදාලව ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය කාර්තු වශයෙන් සහ වාර්ෂිකව සකස් කර කළමණාකාරීත්වය දැනුවත් කිරීමටත් වාර්ෂික ප්‍රගති සමාලෝචන වාර්ථාව විගණන අංශය වෙත යොමුකිරීමටත් සටහන් කරගතිමි.	ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් කාලීනව සමාලෝචනය කර අවශය නිවැරදි කිරීම් සිදු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය **2024** වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ගත දත්ත මූල්‍ය ප්‍රකාශන දත්ත සමඟ සැසඳීමේදී ආදායම් ප්‍රකාශනයේ අයිතම් **09** ක වටිනාකම් හා අයවැය වටිනාකම් අතර සියයට **6** ක සිට සියයට **1,354** ක පරාසයක වෙනස්කම් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතම් **18** ක වටිනාකම් සහ අයවැය වටිනාකම් අතර සියයට **12** ක සිට සියයට **333** ක පරාසයක වෙනස්වීම් නිරීක්ෂණය විම හේතුවෙන් අයවැය ලේඛණය පළදායි පාලන උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබුණි.	ඉදිරියේදී ඇස්තමේන්තු ගත අයවැය හා සත්‍ය වියදම්වලට ආසන්නව හෝ ගැලපෙන ලෙස පවත්වාගැනීමට කටයුතු කරන අතර සංශෝධනයක් අවශ්‍ය වන අවස්ථා ඇතිවුවහොත් එහිදී අයවැය සංශෝධනය කිරීමට පියවර ගැනීමට සටහන් කරගතිමි.	අයවැය දත්ත හැකිතාක් නිවැරදිව පිළියෙල කර මූල්‍ය පාලන උපකරණයක් ලෙස යොදාගත යුතුය.

4.3 වෙනත් කරුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් 2009 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.මිලියන 500 ක් වටිනා පර්චස් 112.5 ක් වූ කොළඹ වොක්ෂෝල් මාවතේ පිහිටි ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාගෙන තිබූ අතර 2018 වර්ෂයේදී එහි නිර්මාණ සැලැසුම් වෙනුවෙන් රු.27,003,862 ක් වැය කර වසර 7 ක් ගත වී ඇතැත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.	ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකරගෙන ගිය ද, මුදල් අමාත්‍යාංශයේම නියෝග පරිදි එකී ඉදිකිරීම් අතර මග නවතා දැමීමට සිදුවී ඇත. මණ්ඩලයට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමේ කටයුතු මහා භාණ්ඩාගාරයට බරක් නොවන අයුරින් සිදුකර ගැනීම උදෙසා ගොඩනැගිලි ඉදිකිරීමේ අරමුදල් ගිණුමක මුදල් ඉතිරි කරමින් පැවතින නමුත්, මුදල් අමාත්‍යාංශය විසින් එම මුදල් ලබා ගත්තද, මණ්ඩලය විසින් ගොඩනැගිල්ල ඉදිකිරීම අතහැර දැමීමක් සිදුකර නොමැත.	මණ්ඩලය සතු වොක්ෂෝල් මාවතේ පිහිටි ඉඩම ඵලදායිව ප්‍රයෝජනයට ගැනීමට සහ එම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 වසරේදී නිර්මාණ සැලසුම් වෙනුවෙන් වැය කර තිබූ රු.මිලියන 27 ක මුදල අනාර්ථික වියදමක් නොවන අයුරින් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලැසුම් කල යුතුය.